# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1712/22 - 2011 ජුනි 30 වැනි බ්‍රහස්පතින්දා - 2011.06.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

**අතුරු ව්‍යවස්ථා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උප වගන්තියේ "*ඌ*" ජේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) (අ) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2011ක් වූ ජුනි මස 09 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

***කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා***

01. මෙම අතුරු ව්‍යවස්ථා පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම, පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුළියට ධාවනයේ යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින්, එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකි ය.

03. පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 02 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල, දෙවැනි උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත් සභාවට මාසිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුළී රථවාහන නවතා තැබීම කළයුතු අතර, එම කුළී රථවාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේ ය.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පොළවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් වෙනුවෙන් ද ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

06. බලපත්‍රය ලබාගැනීම සඳහා තුන්වන උපලේඛනයේ ප්‍රකාර පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම් කළ යුතු ය.

07. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බල පත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

08. සෑම මසක ම පළමුවැනි දිනට පෙර අදාළ මාසය සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

09. පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුළී රථ වාහන නවතා තැබීමේ නැවතුම්පොළකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14 කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුළී රථ වාහන නැවතුම්පොළකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතුය. එසේ දැන්වීමක් නොකළහොත් අදාළ මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුළී රථ වාහන, නැවතුම්පොල තුළ දී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයකු ලවා සේදීමට සැළැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුළීරථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හෝ හැසිරීම හෝ හිරිහැරයක් වනසේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඩුවමකට සහ / හෝ දඩයකට අමතරව මෙමෙ අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නිත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පාතදුම්බර ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිළධාරියා" යන්නෙන් පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිළධාරියෙකු ද,

"රථ වාහන පාලක" යන්නෙන් පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිළධාරියෙකු අදහස් වේ.

"මෝටර් රථය හෝ කුළී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන්රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛන 01*

*පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීමට අනුමත ස්ථාන ඃ*

1. මඩවල සිරිමල්වත්ත හන්දියේ සිට නුවර පාරේ වත්තේගම දෙසට ඇති බස් නැවතුම්පලේ සිට මීටර් 15ක් දුරට
2. දොරගමුව හන්දියේ සිට දොරගමුව දෙසට මීටර් 50ක් දුරින් ආරම්භ වී මීටර් 50ක් දුරට
3. උඩතලවින්න මන්සන්ධියේ සිට පල්ලේතලවින්නට යන මාර්ගය ආරම්භ වන ස්ථානයේ සිට දොරගමුව දෙසට ප්‍රධාන මාර්ගයේ මීටර් 05ක් දුර සිට මීටර් 25ක් දුරට
4. උඩතලවින්න ගලදෙනිය හන්දියේ සිට ගලදෙනිය දෙසට මීටර් 05ක් දුර සිට ගලදෙනිය දෙසට මීටර් 30ක් දුරට
5. තුන්කදුර හන්දියේ සිට මීටර් 05ක් දුරින් දොරගමුව දෙසට මීටර් 50ක් දුරට
6. පොල්ගොල්ල උයන්වත්ත හන්දියේ සිට මීටර් 15ක් උයන්වත්ත දෙස සිට මීටර් 50ක් දුරට
7. මඩවල වංගුව කඩේ හපුගස්තැන්න හන්දියේ සිට මීටර් 05ක් නුවර දෙස සිට මීටර් 30ක් දුරට
8. වත්තේගම පාරේ මඩවල හන්දියේ සිට මීටර් 50ක් වත්තේගම දෙසට ලංකා බැංකුව ඉදිරිපිට
9. නාපාන පාරේ (තෙල්දෙනිය පාරේ) මඩවල හන්දියේ සිට තෙල්දෙනිය දෙසට මීටර් 50ක් දුරින්, එනම් තෙල්දෙනිය පාරේ පිහිටි බස් නැවතුම් පලෙන් තෙල්දෙනිය දෙසට
10. නාපාන පාරේ 8 කනුව පට්ටියතැන්න හන්දියේ සිට මීටර් 50ක් තෙල්දෙනිය දෙසට
11. නාපාන පාරේ වලල හන්දියේ සිට වලල වාවින්න පාරේ මීටර් 50ක් දුරින්, වාවින්න දෙසට
12. නාපාන පාරේ වලල හන්දියේ සිට තෙල්දෙනිය දෙසට මීටර් 50ක් දුරින්, එනම් තැපැල් කාර්යාලය ඉදිරිපිට පන්සල අසල දක්වා.
13. වලල කිරිමැටිය පාරේ කෙවඩන්තැන්න හන්දියේ සිට මීටර් 50ක් අමුණුගම දෙසට
14. නාපාන පාරේ ගල්ඒදණ්ඩ හන්දියේ සිට තෙල්දෙනිය දෙසට මීටර් 50ක් දුරට
15. වත්තේගම පාරේ බංගලාගෙදර හන්දියේ සිට වත්තේගම දෙසට මීටර් 50ක් දුරට
16. නවයාලතැන්න හන්දියේ සිට නුවර පාරේ වත්තේගම දෙසට මීටර් 15ක් දුරින් පටන්ගෙන මීටර් 65 දක්වා වන මීටර් 50 කොටස
17. ජම්බුගහපිටිය හන්දියේ සිට නවයාලතැන්න දෙසට දකුණු පැත්තේ මීටර් 15ක් දුරින් පටන්ගෙන මීටර් 65 දක්වා වන මීටර් 50 කොටස
18. අළුත්ගම රෝහල හන්දියේ සිට ජම්බුගහපිටිය දෙසට මීටර් 15න් ආරම්භ වී මීටර් 65 දක්වා වන මීටර් 50 කොටස
19. අඹතැන්න නගර මන්සන්ධියේ සිට පූජාපිටිය පාරේ වම් පැත්තේ මීටර් 15න් ආරම්භ වී මීටර් 65න් අවසන් වන මීටර් 50 කොටස
20. කුඩුගල හන්දියේ සිට මහනුවර පාරේ වම් පැත්තේ මීටර් 15න් ආරම්භ වී මීටර් 65න් අවසන් වන මීටර් 50 කොටස
21. කටුගස්තොට පොලිසිය අසල කළුගල හන්දියේ සිට මීටර් 15ක් දුරින් පටන් ගෙන මීටර් 65 දක්වා මීටර් 50 කොටස මාතලේ දෙසට දකුණු පැත්තේ
22. පල්ලේතලවින්න ගාමන්ට් හන්දියේ සිට ගාමන්ට් එක දෙසට දකුණු පැත්තෙන් මීටර් 15න් පටන් ගෙන මීටර් 70 දක්වා අවසන් වන මීටර් 55 කොටස
23. බොකලවෙල හන්දියේ සිට පල්ලියවත්ත දෙසට දකුණු පැත්තෙන් මීටර් 15න් පටන් ගෙන මීටර් 30 දක්වා අවසන් වන මීටර් 15 කොටස
24. අඹතැන්න බෝගස්ගොඩ හන්දියේ සිට මාතලේ දෙසට දකුණු පැත්තෙන් මීටර් 15න් පටන්ගෙන මීටර් 65 දක්වා අවසන් වන මීටර් 50 කොටස

*උපලේඛන 02*

*කුලී රථ වාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු :*

| | | | |
|---|---|---|---|
| 01. | ලොරියක් සඳහා | - | රු.100 |
| 02. | වෑන් රථයක් සඳහා | - | රු.100 |
| 03. | ට්‍රැක්ටරයක් සඳහා | - | රු.100 |
| 04. | ත්‍රීරෝද රථයක් සඳහා | - | රු. 50 |
| 05. | මෝටර් රථයක් සඳහා | - | රු. 50 |
| 06. | අත් ට්‍රැක්ටරයක් සඳහා | - | රු. 50 |

*උපලේඛන අංක 03*

**පාතදුම්බර ප්‍රාදේශීය සභාව**

***වාහන ලියාපදිංචිය සඳහා හා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත***

1. වාහනයේ අංකය සහ වර්ගය : ______________________
2. අයිතිකරුගේ නම : ______________________
3. හැඳුනුම්පත් අංකය : ______________________
4. අයිතිකරුගේ ලිපිනය : ______________________
5. රියදුරුගේ නම : ______________________
6. රියදුරුගේ හැඳුනුම්පත් අංකය : ______________________
7. රියදුරු බලපත්‍ර අංකය : .______________________
8. රියදුරුගේ ලිපිනය : .______________________
9. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය : ______________________
10. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යක් සඳහා ද? : ______________________
11. එහි ධාරිතාව - ප්‍රමාණය : .______________________

ඉහත තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

______________________,

දිනය : ______________________ අයදුම්කරුගේ / රියදුරුගේ අත්සන.

සභාපතිගේ අනුමැතිය

රු. ______________________ ක ගාස්තුවක් අයකර බලපත්‍රය ලබා දීම අනුමත කරමි./නොකරමි.

______________________,

දිනය : ______________________ සභාපති,

පාතදුම්බර ප්‍රදේශීය සභාව.

07-389/1

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

**අතුරු ව්‍යවස්ථා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උප වගන්තියේ "උ" ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) (අ) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2011 ජුනි මස 09 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

***කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා***

01. මෙම අතුරු ව්‍යවස්ථා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම, පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව විසින් අනුමතකර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකි ය.

03.පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 02 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල දෙවැනි උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත් සභාවට මාසිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුලී රථවාහන නවතා තැබීම කළයුතු අතර, එම කුලී රථවාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේ ය.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පලවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් වෙනුවෙන් ද, ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

06. බලපත්‍රය ලබාගැනීම සඳහා තුන්වන උපලේඛනයේ ප්‍රකාර පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම් කළ යුතු ය.

07. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බල පත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

08. සෑම මසක ම පළමුවැනි දිනට පෙර අදාළ මාසය සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

09. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුලී රථ වාහන නවතා තැබීමේ නැවතුම් පොලකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14 කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථ වාහන නැවතුම්පලකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම්, ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතුය. එසේ දැන්වීමක් නොකළහොත් අදාළ මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලීරථ වාහන, නැවතුම්පල තුළ දී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුලීරථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හෝ හැසිරීම හෝ හිරිහැරයක් වනසේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිම පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ / හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නිත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"රථ වාහන පාලක" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිලධාරියෙකු අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන්රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛන අංක 01*

*පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීමට අනුමත ස්ථාන ඃ*

| | | | |
|---|---|---|---|
| 1. | බලංතොට ශාන්ත ජනපදය | - | බලංතොට බෝධිරුක්ඛාරාමයට ඇතුළුවන ස්ථානයේ සිට ගිනිගත්හේන ප්‍රධාන මාර්ගයේ අඩි 40ක් දිගට |
| 2. | බලංතොට හන්දිය | - | බලංතොට නාගස්තැන්න හන්දිය අංක 03, බලංතොට හාඩ්වෙයාර් ඉදිරිපිට දිග අඩි 50ක් දිගට |
| 3. | රඹුක්පිටිය පන්සල | - | රඹුක්පිටිය පන්සල හන්දියේ 1/5 බෝක්කුව සිට අඩි 50ක් දුරට ගිනිගත්හේන ප්‍රධාන මාර්ගය (තැපැල් කාර්යාලය ඉදිරිපිට) |
| 4. | වැලිගම්පල හන්දිය | - | වැලිගම්පල, දෙකිඳ, හන්දියේ අඩි 50ක ප්‍රමාණය |
| 5. | ෂෙම්රොක් හන්දිය (වැඩිහිටි නිවාස හන්දිය) | - | බස්නැවතුම්පලට යාබදව සොහොන පාරේ අඩි 50ක් දිගට |

| | | | |
|---|---|---|---|
| 6. | වෙරළුගස්හින්න හන්දිය | - | කටුකිතුල පාර වම්පල දකුණු පස හන්දියේ සිට අඩි 50ක් |
| 7. | කඩියන්ලෙන හන්දිය | - | කඩියන්ලෙන නගරය දකුණු පස වරිපනම් අංක 54 සිට වරිපනම් අංක 78 දක්වා කොටස |
| 8. | වෙස්ට්හෝල් හන්දිය | - | අංක 01 බස්නැවතුම්පොල ඉදිරියට - දිගට අඩි 40 අංක 02 කෝවිල ඉදිරිපිට දිගට අඩි 35 |

*උපලේඛන 02*

කුලී රථ වාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු

(අ) ත්‍රීරෝද රථයක් සඳහා - රු. 100

*උපලේඛන අංක 03*

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

***වාහන ලියාපදිංචිය සඳහා හා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත***

1. වාහනයේ අංකය සහ වර්ගය : ..........................................................
2. අයිතිකරුගේ නම : ..........................................................
3. හැඳුනුම්පත් අංකය : ..........................................................
4. අයිතිකරුගේ ලිපිනය : ..........................................................
5. රියදුරුගේ නම : ..........................................................
6. රියදුරුගේ හැඳුනුම්පත් අංකය : ..........................................................
7. රියදුරු බලපත්‍ර අංකය : ..........................................................
8. රියදුරුගේ ලිපිනය : ..........................................................
9. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය : ..........................................................
10. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යක් සඳහා ද? : ..........................................................
11. එහි ධාරිතාව - ප්‍රමාණය : ..........................................................

ඉහත තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

..........................................................
අයදුම්කරුගේ / රියදුරුගේ අත්සන

දිනය : ..........................................................

සභාපතිගේ අනුමැතිය

රු. .................................................... ක ගාස්තුවක් අයකර බලපත්‍රය ලබා දීම අනුමත කරමි./නොකරමි.

..........................................................
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

දිනය : ..........................................................

07-389/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.